අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2003 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2003

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නො ගැළපේ**. එම **නො ගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය **තිත් ඉර මත** ලියන්න.

01. (1) දීපවංස (2) සමන්තපාසාදිකා (3) මහාවංස
(4) වංසත්ථප්පකාසිනී (5) පැරකුම්බා සිරිත (...........)

02. (1) දක්ඛිණදේස (2) උත්තරදේස (3) පච්ඡිමදේස
(4) මධ්‍යදේස (5) පාචීනදේස (...........)

03. (1) මහාතිත්ථ (2) සූකරතිත්ථ (3) කච්ඡකතිත්ථ
(4) උරුවේල (5) ගෝකණ්ණ (...........)

04. (1) සිවිකා (2) දෝලි (3) ඉදෝලි
(4) තවලම් (5) කුණම් (...........)

05. (1) තිසර සන්දේශය (2) පරෙවි සන්දේශය (3) සැළලිහිණි සන්දේශය
(4) හංස සන්දේශය (5) ගිරා සන්දේශය (...........)

06. (1) ලෝපේස් ද සූසා (2) ජෙරනිමෝ ද අසවේදු (3) කොන්ස්තන්තීනු ද සා
(4) විලෙම් ජේ.කොස්ටර් (5) දියෝගු ද මේලෝ (...........)

07. (1) රෝමානු කතෝලික සමය (2) රෝම-ලන්දේසි නීතිය (3) සිවිල්රාද්
(4) ලෑන්ඩ්රාද් (5) කොමාන්ඩරිය (...........)

08. (1) ජේම්ස් කෝඩිනර් (2) එමර්සන් ටෙනන්ට් (3) ජෝන් ඩේවි
(4) ෆර්නාඕ ද කේරෝස් (5) තෝමස් ස්කිනර් (...........)

09. (1) ගොන්ගාලේගොඩ බණ්ඩා (2) බූටාවේ රටේරාල (3) කැප්පෙටිපොළ
(4) මඩුගල්ලෙ (5) විල්බාවේ (...........)

10. (1) මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ (2) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ
(3) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ (4) සෝල්බරි ප්‍රතිසංස්කරණ
(5) කෲව් - මැකලන් ප්‍රතිසංස්කරණ (...........)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක අඩංගුවී ඇති නම් **එකිනෙකට නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

11. (1) ගමක පාලනය සඳහා වූ නීතිරීති - කොණ්ඩවට්ටවාන් සෙල් ලිපිය
(2) වෙළෙඳ නගරයක පාලනය සඳහා වූ නීතිරීති - බදුල්ල වැව් ලිපිය
(3) වැවකින් ජලය බෙදාදීමේ නීතිරීති - වෙස්සගිරි පුවරු ලිපිය
(4) විහාරගම් පාලනය සඳහා වූ නීතිරීති - වේවැල්කැටිය සෙල් ලිපිය
(5) භික්ෂූන් සඳහා වූ උපදෙස් සහ නීතිරීති - කලුදිය පොකුණ සෙල් ලිපිය (...........)

Past Papers Wiki

12. (1) තිසා වැව - අනුරාධපුර දිස්ත්‍රික්කය
(2) තෝපා වැව - කුරුණෑගල දිස්ත්‍රික්කය
(3) පරාක්‍රම සමුද්‍රය - පොළොන්නරුව දිස්ත්‍රික්කය
(4) ඉරණමඩු වැව - කිලිනොච්චි දිස්ත්‍රික්කය
(5) සේනානායක සමුද්‍රය - අම්පාර දිස්ත්‍රික්කය (..........)

13. (1) දේවානම්පියතිස්ස රජු - මහා මහින්ද ථෙර
(2) සිරිමේඝවණ්ණ රජු - හේමමාලා කුමරිය
(3) මහානාම රජු - ෆාහියන් භික්ෂුව
(4) බුද්ධදාස රජ - බුද්ධඝෝෂ ථෙර
(5) මහාසේන රජු - සංඝමිත්ත භික්ෂුව (..........)

14. (1) 1797 කැරැල්ල - ෆ්‍රෙඩ්රික් නෝර්ත්
(2) 1817-1818 නැගී සිටීම - රොබර්ට් බ්‍රවුන්රිග්
(3) 1848 නැගී සිටීම - ටොරිංටන් සාමිවරයා
(4) 1883 කොටහේන කැරැල්ල - ආතර් ගෝර්ඩන්
(5) 1915 කෝලාහල - රොබට් චාර්මස් (..........)

15. (1) ඩබ්ලිව්.ඒ.සිල්වා - විජයබා කොල්ලය
(2) එස්.මහින්ද හිමි - සුනේත්‍රා හෙවත් අවිචාර සමය
(3) මාර්ටින් වික්‍රමසිංහ - රෝහිණී
(4) පියදාස සිරිසේන - ජයතිස්ස සහ රොසලින්
(5) සයිමන් ද සිල්වා - මීනා (..........)

- අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම / ප්‍රකාශ / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශ / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට **ගැළපේ.** එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළකට නොවේ. Y තීරුව, X තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළකට සකස් කළවිට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරැදි ය. නිවැරැදි සංයෝගයට අයත් අංකය තෝරා **තිත් ඉර මත** ලියන්න.

16.

| X | Y |
|---|---|
| (i) මයූරපාද හිමි | A යාල්පාන වෛපව මාලෛ |
| (ii) ධර්මසේන හිමි | B අමාවතුර |
| (iii) විද්‍යාචක්‍රවර්ති | C බුත්සරණ |
| (iv) ගුරුළුගෝමි | D සද්ධර්මරත්නාවලිය |
| (v) මයිලවාක්නාපුලවර් | E පූජාවලිය |

(1) EDCBA (2) ECBAD (3) EBADC (4) EADCB (5) EDBCA (..........)

17.

| X | Y |
|---|---|
| (i) ලංකාතිලක විහාරය | A දේවානම්පියතිස්ස රාජ්‍ය සමය |
| (ii) කණ්ඨක චේතිය | B පළමුවන රාජසිංහ රාජ්‍ය සමය |
| (iii) අභයගිරිය | C පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමය |
| (iv) ආළාහන පිරිවෙන | D වට්ටගාමණී රාජ්‍ය සමය |
| (v) බැරන්ඩි කෝවිල | E හතරවන බුවනෙකබාහු රාජ්‍ය සමය |

(1) EDCBA (2) ECBAD (3) EBADC (4) EADCB (5) EDBCA (..........)

18.

| X | Y |
|---|---|
| (i) රුවන්වැලිසෑ පුවරු ලිපිය | A පළමුවන විජයබාහු රජු |
| (ii) ගල්පොත ලිපිය | B හයවන බුවනෙකබාහු රජු |
| (iii) දැදිගම පුවරු ලිපිය | C දෙවන පරාක්‍රමබාහු රජු |
| (iv) දඹදෙණි කතිකාවත | D නිශ්ශංකමල්ල රජු |
| (v) පනාකඩුව තඹ සන්නස | E කල්‍යාණවතී රජින |

(1) EDCBA (2) ECBAD (3) EBADC (4) EADCB (5) EDBCA (..........)

19. X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | හයවන විජයබාහු රජු | A | 1638 ගිවිසුම |
| (ii) | සෙනරත් රජු | B | 1766 ගිවිසුම |
| (iii) | කීර්ති ශ්‍රී රාජසිංහ රජු | C | 1617 ගිවිසුම |
| (iv) | දෙවන රාජසිංහ රජු | D | 1815 උඩරට ගිවිසුම |
| (v) | රොබර්ට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා | E | 1518 ගිවිසුම |

(1) EDCBA (2) ECBAD (3) EBADC (4) EADCB (5) EDBCA (..........)

20. X | Y

| | X | | Y |
|---|---|---|---|
| (i) | යාපනය තෙක් උතුරු දිග දුම්රිය මාර්ගය | A | විලියම් ග්‍රෙගරි |
| (ii) | කොළඹ-මහනුවර මාර්ගය | B | එඩ්වර්ඩ් බාර්න්ස් |
| (iii) | කොළඹ වරාය | C | විලියම් මැනිං |
| (iv) | කොළඹ මහ නගර සභාව | D | හර්කියුලීස් රොබින්සන් |
| (v) | විශ්වවිද්‍යාල කොලීජිය | E | වෙස්ට් රිජ්වේ |

(1) EDCBA (2) ECBAD (3) EBADC (4) EADCB (5) EDBCA (..........)

- අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයකට දක්වා ඇති A,B,C සහ D යන ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. **නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

A සහ B පමණක් නිවැරදි නම් ............ 1 ද,
B සහ C පමණක් නිවැරදි නම් ............ 2 ද,
C සහ D පමණක් නිවැරදි නම් ............ 3 ද,
A සහ C පමණක් නිවැරදි නම් ............ 4 ද,

ප්‍රතිචාර එකක් හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් **5 ද, තිත් ඉර මත** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| A සහ B පමණක් නිවැරදි ය. | B සහ C පමණක් නිවැරදි ය. | C සහ D පමණක් නිවැරදි ය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

21. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස ඇති කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ආර්යයන් පැමිණියේ දකුණු ඉන්දියාවෙනි.
(B) ආර්යයන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මයයි.
(C) ආර්යයෝ ගංගා නිම්න ආශ්‍රිත ව ජනාවාස ගණනාවක් ම පිහිටුවා ගත්හ.
(D) ඔවුන්ගේ සියලු ම ජනාවාස පැවතියේ වියළි කලාපයේ ය. (..........)

22. අනුරාධපුරයේ සිට පොළොන්නරුවට අග නගරය මාරු කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) කලබලකාරී රෝහණ ප්‍රදේශය පාලනය කිරීම සඳහා
(B) අනුරාධපුරයට වඩා පොළොන්නරුව මධ්‍යගත ව පිහිටීම
(C) මායා රටින් ආක්‍රමණ එල්ලවීම.
(D) මෝරිය සහ ලම්බකර්ණ පෙළපත් අතර ගැටුම් (..........)

23. හයවන පරාක්‍රමබාහු රජුගේ කාර්ය සංසිද්ධීන් පිළිබඳ ව පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම. (B) කෝට්ටේ බලකොටුවක් ඉදිකිරීම.
(C) වන්නි ප්‍රධානීන් යටත් කිරීම. (D) රාමඤ්ඤ දේශයට ආක්‍රමණයක් මෙහෙයවීම. (..........)

24. සීතාවක රාජධානිය හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) සීතාවක රාජධානිය පිහිටුවන ලද්දේ 1796 වර්ෂයේ දී ය.
(B) සීතාවක රාජසිංහ රජු විසින් කොළඹ කොටුව අල්ලා ගන්නා ලදී.
(C) එහි ප්‍රථම පාලකයා වූයේ මායාදුන්නේ රජු ය.
(D) සීතාවක රජවරු මුස්ලිම් වෙළෙඳුන් ආරක්ෂා කළහ. (..........)

Past Papers Wiki

25. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීම.
(B) සර්වජන ඡන්ද බලය හඳුන්වා දීම.
(C) කැබිනට් ක්‍රමය හඳුන්වා දීම.
(D) වතු ආර්ථිකය හඳුන්වා දීම. (..........)

● අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය, **ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

26. එළාර රජුට සහාය දීම සඳහා පැමිණි දකුණු ඉන්දීය දමිළ නායකයාගේ නම කුමක් ද?
(1) දීඝජන්තු (2) භල්ලුක (3) පනයමාර (4) පුළහත්ථ (5) දාඨික (..........)

27. මහාසේන රජුගේ පාලන සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර කාරණය නිවැරදි වේ ද?
(1) වසභ රජුගේ මරණයෙන් පසු මහාසේන රජු සිහසුනට පත් විය.
(2) මහාසේන රජු අභයගිරි විහාරය ඉදි කළේය.
(3) මහාසේන රජුගේ පාලන සමයෙන් දීපවංසය අවසන් වෙයි.
(4) ඔහුගේ නම පත්තිනි ඇදහිල්ල සමග සම්බන්ධව පවතී.
(5) ඔහුගේ නාමය කාලවාපිය (කලාවැව) සමග අමරණීය ලෙස බැඳී තිබේ. (..........)

28. පහත දැක්වෙන පාලකයන් අතුරෙන් බුද්ධාගම නගා සිටුවීම සඳහා ඉතා වැදගත් දායකත්වයක් ලබා දුන් නායක්කර් පාලකයා නම් කරන්න.
(1) දෙවන රාජසිංහ රජු (2) දෙවන විමලධර්මසූරිය රජු (3) ශ්‍රී විජය රාජසිංහ රජු
(4) රාජාධි රාජසිංහ රජු (5) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (..........)

29. පහත සඳහන් පනත්වලින් කවර පනතක් රාජකාරි ක්‍රමය නැවත ඇති කිරීමට ගත් උත්සාහයක් ලෙස දේශීය ජනතාව විසින් සලකන ලද්දේ ද?
(1) 1840 අංක 12 දරන මුඩුබිම් පනත
(2) 1848 අංක 8 දරන මහාමාර්ග ආඥා පනත
(3) 1865 අංක 17 දරන මහ නගර සභා පනත
(4) 1892 අංක 4 දරන ධාන්‍ය බදු පනත
(5) 1905 අංක 8 දරන බෞද්ධ විහාර දේවාලගම් පනත (..........)

30. පහත සඳහන් සංවිධාන අතුරෙන් දහනවවන සියවසේ දී බෞද්ධ පුනරුදයට දායක වූයේ කුමන සංවිධානය ද?
(1) මෝර්ගන් කොමිසම
(2) ශෛව ප්‍රගාස සභා
(3) ලංකා සංගමය (Ceylon League)
(4) බෞද්ධ පරමවිඥනාර්ථ සමාගම
(5) මුස්ලිම් අධ්‍යාපන සංගමය (..........)

● අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට **නො ගැළපේ.** එම කරුණ තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත** ලියන්න.

31. **දඹදෙණි රාජවංශය**
(1) තුන්වන විජයබාහු රජු මෙම රාජවංශයේ ආරම්භකයා විය.
(2) තුන්වන විජයබාහු රජු සිය කාර්යයන් ආරම්භ කළේ වන්නි ප්‍රධානියෙකු ලෙස ය.
(3) තුන්වන විජයබාහු රජුට පසු ව දෙවන පරාක්‍රමබාහු රජු සිහසුනට පත් විය.
(4) හතරවන පරාක්‍රමබාහු රජුගේ මරණයෙන් පසු දඹදෙණි රාජවංශය අවසන් විය.
(5) චෙං හෝ නමැති චීන සෙන්පතියා දඹදෙණි රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවට පැමිණියේය. (..........)

32. **චෛත්‍යඝර**
(1) චෛත්‍යඝර යනු බෝධි වෘක්ෂය වටා ඉදි කරන ලද ගොඩනැගිල්ලකි.
(2) අනුරාධපුරයේ ඇති ථූපාරාමය පැරණි ම චෛත්‍යඝරය වේ.
(3) අභයගිරි විහාර සංකීර්ණයේ ඇති ලංකාරාම ස්තූපය ද චෛත්‍යඝරයක ස්වරූපයෙන් නිමකරන ලද්දකි.
(4) වටදාගෙය යනු චෛත්‍යඝරයට තවත් නමකි.
(5) මණ්ඩලගිරි චෛත්‍යඝරය පශ්චාත් අනුරාධපුර යුගයේ දී ඉදි කරන ලදී. (..........)

33. **මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය**
(1) ඉහළ ම විධායක හා අධිකරණ බලතල රජු වෙත පැවති තිබිණ.
(2) අදිකාරම්වරු රජු ළඟට සිටි උසස් ම නිලධාරීහු වූහ.
(3) පරිපාලන බෙදීම් දිසාවනි හා රට යනුවෙන් හැඳින්විණි.
(4) ඉහළ ම අධිකරණ උසාවිය මහනඩුව නමින් හැඳින්විණි.
(5) මරණීය දණ්ඩනය පැනවීමට අදිකාරම්වරුන්ට බලය තිබුණි. (..........)

34. **දහනවවන සියවසේ හින්දු පුනරුදයෙහි ලා අරුමුග නාවලර්ගේ දායකත්වය**

(1) හින්දු පුනරුදය අරුමුග නාවලර් විසින් මෙහෙයවන ලදී.
(2) හෙතෙම බෞද්ධ පරම විඥනාර්ථ සමාගම සමඟ සමීප සම්බන්ධතා පැවැත් විය.
(3) ඔහු ආගමික නවෝදයක් ඇති කිරීමෙහි ලා පාසැල්වල හා අධ්‍යාපනයේ ඇති වටිනාකම තෝරා දුන්නේ ය.
(4) නාවලර් 1888 දී ශෛව පරිපාලන සභාව පිහිටු විය.
(5) 1872 දී ඔහු විසින් ආරම්භ කරන ලද ශෛවන්ගල් විද්‍යාශාලෙයි පසු කාලයේ දී යාපනයේ හින්දු විද්‍යාලය නමින් හැඳින්විණි. (..........)

35. **දහනවවන සියවසේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ අධ්‍යාපනය**

(1) ෆෙඩරික් නෝර්ත් ආණ්ඩුකාරයා මිෂනාරි අධ්‍යාපනයට අනුග්‍රහ දක්වී ය.
(2) කෝල්බෲක් කොමිසම ඉංග්‍රීසි අධ්‍යාපනය නිර්දේශ කළේ ය.
(3) බ්‍රිතාන්‍යයෝ සිය පාලනයේ ආරම්භයේ සිට ම අධ්‍යාපනය අනිවාර්ය කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළහ.
(4) මේරි හිගින්ස් බෞද්ධ කාන්තා අධ්‍යාපනයේ නායිකාවක් වූවා ය.
(5) මෝර්ගන් කොමිසම අධ්‍යාපන විකාශයේ සන්ධිස්ථානයක් සනිටුහන් කළේ ය. (..........)

- පහත දැක්වෙන අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශය දැයි තෝරා එම අංකය **තිත් ඉර මත** ලියන්න.

| | පළමුවෙනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරැදිය. | නිවැරැදිය. |
| 2. | නිවැරැදිය. | වැරැදිය. |
| 3. | වැරැදිය. | වැරැදිය. |
| 4. | වැරැදිය. | නිවැරැදිය. |
| 5. | නිවැරැදිය. | නිවැරැදිය, පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | දෙවන මෝගල්ලාන රජතුමා මල්වතුඔය හරහා වේල්ලක් බැඳ වැව් තුනක් සෑදවී ය. | මෙම වැව් අතුරෙන් එකක් වූ පත්තපාසාන වාපිය අභිලේඛන මූලාශ්‍රවලට අනුව වර්තමාන නාච්චදූව වැව ලෙස හඳුනාගත හැක. | (..........) |
| 37. | පණ්ඩුකාභය රජුගේ අගනුවර වූයේ පොළොන්නරුවයි. | මාඝ, වර්ෂ 1215 දී පොළොන්නරුව යටත් කර ගත්තේ ය. | (..........) |
| 38. | කේරෝස් විසින් රචිත ලංකාධිපත්‍යය නම් ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ පෘතුගීසි කටයුතු අධ්‍යයනය කිරීමේ ලා වැදගත් ඓතිහාසික මූලාශ්‍රයකි. | බල්දෙයස්, ශ්‍රී ලංකාවේ කතෝලික ආගමේ ව්‍යාප්තිය විස්තර කරයි. | (..........) |
| 39. | සිද්දි ලෙබ්බේ, මුස්ලිම් නෙයිසන් නම් පුවත්පත ආරම්භ කළේ ය. | ලංකා ජාතික සංගමයේ ආරම්භක සභාපතිවරයා වූයේ පොන්නම්බලම් අරුණාචලම් ය. | (..........) |
| 40. | ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්ෂ 1832 දී ක්‍රියාත්මක කරන ලදී. | ඩොනමෝර් කොමිසම රාජකාරි ක්‍රමය අහෝසි කිරීමට නිර්දේශ කළේ ය. | (..........) |

PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2003 අගෝස්තු

General Certificate of Education(Advanced Level) Examination, August 2003

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න

## II කොටස

01. දහතුන්වන සියවස අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි භූගෝලීය සාධක බලපෑ ආකාරය පහත සඳහන් මාතෘකා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.
    (i) ඉන්දියාව ආසන්නයේ පිහිටීම. (ii) ගංගාවල වැදගත්කම.
    **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

02. දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය සමය දේශපාලන සහ සංස්කෘතික වශයෙන් වැදගත් වන ආකාරය විමසන්න. **(ලකුණු 14 යි)**

03. පහත දැක්වෙන ප්‍රකාශයන්ගෙන් ඕනෑ ම **දෙකක්** කෙරෙහි අවධානය යොමු කරමින් පොළොන්නරු රාජධානියේ පිරිහීමට බලපෑ ප්‍රධාන සාධක විචාරාත්මක ව පරීක්ෂා කරන්න.
    (i) පළමුවන පරාක්‍රමබාහු රජුගේ ප්‍රතිපත්ති (ii) කාලිංග මාඝගේ ආක්‍රමණය
    (iii) කාලිංග සහ පාණ්ඩ්‍ය පෙළපත් අතර ගැටුම්
    **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

04. පශ්චාත් පොළොන්නරු යුගය හා සම්බන්ධ පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම ප්‍රමාණ කරන්න.
    (i) දඹදෙණි යුගයේ සාහිත්‍යය (ii) අලකේශ්වර පවුලේ අග නගරය ලෙස රයිගම නැගී ඒම.
    (iii) යාපනය රාජ්‍යය (iv) කෝට්ටේ නගරයේ වර්ධනය
    (v) කෝට්ටේ යුගයේ විදේශ වෙළෙඳාම.
    **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

05. ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් යටතේ පැවති පරිපාලන සංවිධානයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න. **(ලකුණු 14 යි)**

06. දෙවන රාජසිංහ රජු සහ ලන්දේසීන් අතර පැවති සම්බන්ධතා සමාලෝචනය කරන්න. **(ලකුණු 14 යි)**

07. 1848 කැරැල්ලට තුඩු දුන් ප්‍රධාන සාධක සාකච්ඡා කරන්න. **(ලකුණු 14 යි)**

08. දහනවවන සියවසේ වතු ආර්ථිකයෙහි වර්ධනයට පහත දැක්වෙන සාධක තුඩු දුන් ආකාරය පැහැදිලි කරන්න.
    (i) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ (ii) රජයේ ප්‍රතිපත්තිය
    **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**

09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
    (i) අනුරාධපුර යුගයේ දී රජු සහ සංඝයා අතර පැවති සම්බන්ධතා
    (ii) මහාසේන රජුගේ රාජ්‍ය සමයේ අවසානය දක්වා වාරිමාර්ග ක්‍රමයේ වර්ධනය
    (iii) පොළොන්නරු යුගයේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
    (iv) අමද්‍යප ව්‍යාපාරය
    (v) ලංකා ජාතික සංගමය
    (vi) නිදහස් අධ්‍යාපනය
    **(එක කොටසකට ලකුණු 07 බැගිනි)**


10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම **ස්ථාන ලකුණු කර, නම් කොට**, ඒවායින් ඕනෑ ම ස්ථාන **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව සටහන් ලියන්න.
    (1) කදම්බ නදී (2) පරාක්‍රම සමුද්‍රය (3) දඹදෙණිය (4) දෙවිනුවර
    (5) බලන (6) නල්ලූර් (7) මඩකලපුව (8) සබරගමු පළාත
    **(නිවැරදි ව ලකුණු කිරීම හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි සටහනකට ලකුණු 05 බැගිනි)**



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ප්‍රශ්න අංකය 10

විභාග අංකය........................................................




PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library